පීපල්ස් ඉන්ෂුරන්ස් පීඑල්සී - 2022
--------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

පීපල්ස් ඉන්ෂුරන්ස් පීඑල්සී ("සමාගම") හි 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ හෝ අලාභ ප්‍රකාශනය සහ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මෙම විගණනය සඳහා ප්‍රසිද්ධ වෘත්තියෙහි යෙදී සිටින වරලත් ගණකාධිකාරී සමාගමක සහය මා ලබා ගන්නා ලදි.

සමාගමේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇති බව මා දරන්නා වූ මතය වේ..

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි  නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක  සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක  සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව  විගණනයේ කොටසක් ලෙස මා විසින්  විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්:

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන  ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියා කර ඇති බව;

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව; සහ

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ.) | ලැබිය යුතු රක්‍ෂණ වයස් විශ්ලේෂණයෙහි සම්බන්ධිත පාර්ශ්ව පහකින් ලැබිය යුතු රක්‍ෂණ ශේෂ රු.10,914,222 ක් ඇතුළත්ව ඇත. කෙසේ වෙතත්, සම්බන්ධිත පාර්ශ්ව වෙතින් ලැබිය යුතු රක්‍ෂණ වාරික සඳහා වෙනම වයස් විශ්ලේෂණයක් පවත්වාගෙන නොතිබුණි. | සාමාන්‍ය වාරික ලැබිය යුතු වයස් විශ්ලේෂණය යටතේම සම්බන්ධිත පාර්ශ්ව ප්‍රතිපත්ති ද සලකා බලනු ලැබේ. දිගු හිඟ ලැබිය යුතු මුදල් ඒ හරහාම නිරීක්ෂණය කරනු ලබයි. | සම්බන්ධිත පාර්ශ්ව වෙතින් ලැබිය යුතු රක්ෂණ වාරික හඳුනාගැනීම සහ අධීක්ෂණය කිරීම සඳහා වෙනම යාන්ත්‍රණයක් පවත්වා ගැනීම නිර්දේශ කෙරේ. |
| (ආ.) | සම රක්ෂණ ක්‍රියාකාරකම් සිදු කිරීම සඳහා නිසි ලේඛනගත වාර්තාකරණ පද්ධතියක් නොතිබුණි. එබැවින්, සම රක්ෂණ කොමිස් අනුපාතය, සම රක්ෂණ කොමිස් මුදල, වාරික අනුපාතය සහ සම-රක්ෂණකරුවන් සමඟ වගකීම් බෙදා හැරීම සහ සම රක්ෂණ කාලය පිළිබඳ සාක්ෂි ලබා ගැනීමට නොහැකි විය. සමාලෝචිත වර්ෂය තුළ සමාගම අවස්ථා දහයකදී සම රක්ෂණ සහාය ලබාගෙන තිබූ අතර එක් අවස්ථාවකදී පමණක් සම රක්ෂණ සහාය ලබා දී ඇති බව නිරීක්ෂණය විය. | සටහන් කර ගන්නා ලදී. ප්‍රතිරක්‍ෂණ අත්පොතේ 18.1 වගන්තියේ මාර්ගෝපදේශ අනුව, නීති දෙපාර්තමේන්තුව තැබීමේ පත්‍රිකාවක් සකස් කර එය ප්‍රතිරක්‍ෂණ දෙපාර්තමේන්තුවට යවයි. 2022 වර්ෂයේදී බාහිර සම රක්‍ෂණ කටයුතු සිදු කර නොමැත. සමාගම ආරම්භයේ සිට සිදු කරන ලද සමරක්ෂණ ලැයිස්තුව අමුණා ඇත. 2022 වර්ෂයේදී බාහිර සම රක්ෂණ ස්ථානගත කිරීම් සිදු කර නොමැති බැවින් තොරතුරු නොමැත. තවද, 2022 දී එක් අභ්‍යන්තර සම රක්ෂණ ඉල්ලීමකට සහාය තහවුරු කර ඇත. 2024 වර්ෂයේදී බලපැවැත්වෙන පරිදි ප්‍රතිරක්‍ෂණ අත්පොතට වඩාත් නිශ්චිත සම රක්‍ෂණ මාර්ගෝපදේශ ඇතුළත් කර ඇත. | සම රක්ෂණ ක්‍රියාකාරකම් සඳහා නිසි ලේඛනගත පද්ධතියක් තිබීම නිර්දේශ කෙරේ. |
| (ඇ.) | හිමිකම් රක්‍ෂණ කටයුතු 2022 ජූලි 26 වැනි දින මෙහෙයුම් කළමනාකරණ කමිටුව (OMC) විසින් අනුමත කරන ලද නෛතික ක්‍රියා පටිපාටි අත්පොතට අනුකූලව සිදු කරනු ලබයි. කෙසේ | කළමනාකාරීත්වය විසින් මෙම දුර්වලතාවය හඳුනා ගත් බැවින්, රාජකාරි වෙන් කිරීමත් සමඟ මූල්‍ය අධිකාරිය පැවරීමේ සංදේශයේ | ප්‍රධාන ව්‍යාපාරික ක්‍රියාවලීන් සඳහා නිසි අභ්‍යන්තර පාලන යාන්ත්‍රණයක් රාජකාරි |

| | | |
|---|---|---|
| වෙතත්, මූල්‍ය ප්‍රතිවිපාක ඇති කරන හෝ මූල්‍ය වාර්තාකරණයට බලපෑමක් ඇති කරන තීරණාත්මක කාර්යයක් සම්පූර්ණ කිරීමට වගකිව යුතු අවම වශයෙන් පුද්ගලයන් දෙදෙනෙකු සහතික කිරීම සඳහා රාජකාරි වෙන් කිරීමක් නොතිබූ බව නිරීක්ෂණය විය. ඒ වෙනුවට, කළමනාකරු - නීති පමණක් වාරික අනුපාතය තීරණය කිරීම, හිමිකම් රක්ෂණ ප්‍රතිපත්ති අනුමත කිරීම, රුපියල් මිලියන 100 ට අඩු අවදානම් හිමිකම් වාරික පිළිගැනීම සහ බැංකු සමඟ ගනුදෙනු කිරීමෙන් සම-රක්ෂණ විධිවිධාන තීරණය කිරීම වැනි ප්‍රධාන ක්‍රියාවලීන් තීරණය කරන බව නිරීක්ෂණය විය. | (MoFA) නිවැරදි කරන ලදී. සම රක්ෂණ ස්ථානගත කිරීම් ප්‍රතිරක්ෂණ දෙපාර්තමේන්තුවේ සහාය ඇතිව කළමනාකරුත් නීති විසින් තීරණය කරනු ලැබේ. | වෙන් කිරීම ඇතුළුව ස්ථාපිත කිරීම නිර්දේශ කෙරේ. |

### 1.5.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විෂයය | පොදු ලෙජරයට අනුව රු. | අනුරූපී වාර්තා අනුව වටිනාකම රු. | වෙනස රු. | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| තක්සේරු ගෙවීම් | 3,324,686,005 | 3,231,391,598 | 93,294,407 | ගෙවූ හිමිකම් උපලේඛනය ගතික වාර්තාවකින් ලබාගෙන ඇති අතර සංවෘත හිමිකම් සහ ගෙවා ප්‍රතික්ෂේප කරන ලද හිමිකම් වලින් සමහරක් ඉදිරි පද්ධතියෙන් ග්‍රහණය කර නොමැත. කෙසේ වෙතත්, වවුචරය හිමිකම් දෙපාර්තමේන්තුව විසින් උත්පාදනය කර ඇති බැවින් සහ බැංකු ප්‍රකාශ සමග සංසන්දනය කරන බැවින් පොදු ලෙජර ශේෂය මගින් ගෙවා ඇති නිවැරදි හිමිකම් පැම පෙන්නුම් කරයි. තක්සේරුකරුගේ ගෙවීම් අදාළ හිමිකම් ගිණුම්වල වෙන වෙනම සටහන් කර ඇත. යෝජිත පරිදි තක්සේරු ගෙවීම් සඳහා වෙනම පොදු ලෙජර ගිණුම් පවත්වාගෙන යාමට සලකා බලනු ලැබේ. | එම වෙනස්කම් කාලෝචිත ලෙස සංසන්දනය කර මූල්‍ය වාර්තාවලට අවශ්‍ය ගැලපීම් සිදු කිරීම නිර්දේශ කෙරේ. |

### 1.5.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ.) සමාගමේ ආයෝජන කමිටුව සඳහා මාර්ගෝපදේශ සැපයීම සඳහා සමාගමට ආයෝජන ප්‍රඥප්තියක් ඇති අතර එය අවසන් වරට 2017 සැප්තැම්බර් 12 වන දින යාවත්කාලීන කර තිබුනි.. ආයෝජන ප්‍රඥප්තියෙහි අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා එහි 10 වන වගන්තියට අනුව, මෙය නිතිපතා සමාලෝචනය කළ යුතුය. කෙසේ වෙතත්, 2017 සිට පසුගිය වසර 06 තුළ මෙහි කිසිදු සමාලෝචනයක් සිදු කර නොමැත. 2023 ජූලි 26 දිනැති අභ්‍යන්තර විගණන වාර්තාවට ලබා දුන් පිළිතුරු අනුව 2023 අගෝස්තු 31 දිනට පෙර මෙය සමාලෝචනය කිරීමට කළමනාකාරිත්වය එකඟ වී ඇත. කළමනාකාරිත්වයට අනුව, 2023 අගෝස්තු 24 වන දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ආයෝජන ප්‍රඥප්තිය සමාලෝචනය කර අනුමත කර ඇත. කෙසේ වෙතත්, යාවත්කාලීන ආයෝජන ප්‍රඥප්තිය විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | කළමනාකරණ කමිටුව විසින් ආයෝජන කමිටු ප්‍රඥප්තිය සමාලෝචනයක් සිදු කරන ලද අතර, 2023 අගෝස්තු 24 දින පැවති රැස්වීමේදී<br><br>අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජිත සංශෝධන අනුමත කරන ලදී. නියමිත කාල සීමාවන් අනුව ප්‍රඥප්ති සමාලෝචන සම්බන්ධයෙන් සිහිකැඳවීම් සිදු කරන ලෙස අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්වරයාට උපදෙස් දෙන ලදී. | මණ්ඩලය විසින් සමාගමේ ප්‍රතිපත්ති කාලානුරූපීව සමාලෝචනය සහතික කළ යුතු අතර ඒවා විගණකවරුන් වෙත සමාලෝචනය සඳහා ඉදිරිපත් කළ යුතුය. |
| (ආ.) සමාගමේ ආයෝජන කටයුතු සඳහා මාර්ගෝපදේශ සැපයීම සඳහා ආයෝජන මෙහෙයුම් අත්පොතක්/ ආයෝජන ප්‍රතිපත්තියක් සකස් කර ඇත. 2023 ජූලි 26 දිනැති අභ්‍යන්තර විගණන වාර්තාවට අනුව 2018 අප්‍රේල් 16 න් පසු ආයෝජන මෙහෙයුම් අත්පොත/ආයෝජන ප්‍රතිපත්තිය සමාලෝචනය කර නොතිබුණි. අභ්‍යන්තර විගණන වාර්තාවට ලබා දුන් පිළිතුර අනුව, 2023 අගෝස්තු වලට පෙර යාවත්කාලීන කිරීමට කළමනාකාරීත්වය එකඟ වී ඇත. තවද, අවශ්‍ය සංශෝධන සිදු කර මෙහෙයුම් කළමනාකරණ කමිටුව වෙත ඉදිරිපත් කර ඇති බව කළමනාකාරිත්වය තහවුරු කර තිබුණි. කෙසේ වෙතත්, යාවත්කාලීන කරන ලද ආයෝජන මෙහෙයුම් අත්පොත/ආයෝජන ප්‍රතිපත්තිය විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | 2022 ජනවාරි 01 දින සිට, මෙහෙයුම් කළමනාකරණ කමිටුව ප්‍රතිපත්ති, අත්පොත් සහ ක්‍රියාවලි සමාලෝචනය සහ අනුමත කිරීම මෙන්ම නව ප්‍රතිපත්ති, අත්පොත් සහ ක්‍රියාවලි අනුමත කිරීමට ප්‍රමුඛත්වය දෙන ලදී. ආයෝජන මෙහෙයුම් අත්පොත සමාලෝචනයකින් පසුව 2023 නොවැම්බර් 23 දින අභ්‍යන්තර විගණනයට ඉදිරිපත් කරන ලදී.. | |
| (ඇ.) හිමිකම් රක්ෂණය සඳහා මණ්ඩලය අනුමත වාරික අනුපාත විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. නීති කළමනාකරුට අනුව හිමිකම් රක්ෂණ අනුපාත වන්නේ කාර්ය මණ්ඩලය සඳහා 0.35%, සාමාන්‍ය අවදානම සඳහා 0.40%, මධ්‍යම | සටහන් කර ගන්නා ලදී . අධ්‍යක්ෂ මණ්ඩලය වාරික ගාස්තු අනුමත නොකරයි/තීරණය නොකරයි. අදාළ රක්ෂණ ක්ෂේත්‍රයේ දක්ෂ වෘත්තිකයන් අවදානම, හිමිකම් ඉතිහාසය සහ | මණ්ඩලය විසින් වෘත්තිකයන් විසින් යෝජනා කරන ලද හිමිකම් රක්ෂණ වාරික අනුපාත |

| | | |
|---|---|---|
| අවදානම් සඳහා 0.45% සහ ඉහළ අවදානම් සඳහා 0.50% වේ. කෙසේ වෙතත්, හිමිකම් රක්ෂණ වාරික අනුපාත අනුමත කිරීම සහ එය අනුමත කරන ලද්දේ කවුරුන්ද යන්න පිළිබඳ තොරතුරු විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | වෙළඳපල තරඟකාරිත්වය සැලකිල්ලට ගනිමින් මිල ගණන් සහ කොන්දේසි තීරණය කරයි. අධිකාරී මට්ටම් සමඟ අනුපාත සහ වට්ටම් වාර්ෂිකව අභ්‍යන්තර විගණනයට ඉදිරිපත් කරනු ලැබේ. | අනුමත කළ යුතු අතර ඒවා සමාලෝචනය සඳහා විගණකවරුන් වෙත ඉදිරිපත් කළ යුතුය. |
| (ඇ.) හිමිකම් රක්ෂණය සඳහා අයදුම්කරුවන්ට උපදෙස් පත්‍රිකාව අනුව හිමිකම් වාර්තාව, බැරකම්වල සහතික වල උපුටා ගැනීම්, හිමිකම් ඔප්පු, ප්‍රධාන මිණුම් සැලැස්ම, වීථි රේඛා සහතිකය, නොපවරා ගැනීමේ සහතිකය, හිමිකම් සහතිකය, වරිපණම් බිල්පත් ගෙවීම් ලියකියවිලි සහ ණය දෙන ආයතනයෙන් ලිපියක් හිමිකම් රක්ෂණ ආවරණයක් අයදුම් කිරීමේදී ඉදිරිපත් කල යුතුය.. කෙසේ වෙතත්, හිමිකම් රක්ෂණ ඔප්පුව නිකුත් කිරීමට පෙර එම ලේඛන ලබාගෙන ගොනු කර ඇති බවට හිමිකම් රක්ෂණ ලිපිගොනු වල වාර්තා වී නොමැත. | සටහන් කර ගන්නා ලදී. 2023 දෙසැම්බර් 08 දින සිට බලපැවැත්වෙන පරිදි පිරික්සුම් ලැයිස්තුවක් හඳුන්වා දී ඇත | හිමිකම් රක්ෂණ ඔප්පු නිකුත් කිරීම සම්බන්ධයෙන් නිසි ලේඛන පද්ධතියක් පවත්වාගෙන යාම නිර්දේශ කෙරේ. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 දෙසැම්බර් 31 දින වන විට සමාගම විසින් දැනටමත් පියවා ඇති හිමිකම් සඳහා අය කර ගත යුතු ලැබිය යුතු හිඟ ප්‍රතිරක්ෂණ රු.26,702,426 ක් වේ. 2022 දෙසැම්බර් 31 න් අවසන් වසර වන විට හිමිකම් පියවා ඇති මෙම රු. මිලියන 26 ක ලැබිය යුතු මුදල් වැඩ වර්ජන, කැරලි කෝලාහල , සිවිල් අරගල සහ ත්‍රස්තවාදී අරමුදලින් ලැබිය යුතු වේ. | සේවාදායකයාට අදාළ හිමිකම් පියවා ඇතත්, ඊට අදාළ සුන්බුන් ගැළපීම් අවසන් කර නොමැත. ගැළපීම් පියවන තුරු, ජාතික රක්ෂණ භාර අරමුදල හිඟ ශේෂය නොපියවනු ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන්, සමාගමේ පාලනයෙන් ඔබ්බට ගිය අයකර ගැනීම් සම්පූර්ණ කිරීමට අපට හැකියාවක් නැත. මුළු හිඟ මුදල රු.9,156,321 ජාතික රක්ෂණභාර අරමුදලේ තාක්ෂණික උපදේශක කමිටුව විසින් අනුමත කර හෙට අතර 2024 පෙබරවාරි ඇතුළත පියවනු ලැබේ. | සමාගම විසින් ගෙවන ලද හිමිකම් සඳහා ප්‍රතිරක්‍ෂණ ලැබිය යුතු මුදල් ඉල්ලා සිටීමට සමාගම අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

### 1.6.2 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2022 දෙසැම්බර් 31 දින වන විට රු. 105,821,453 දිගුකාලීන හිඟ අතිරික්ත වාරික ශේෂයක් පවතින බව සටහන් විය (දින 365කට වැඩි කාලයක් සඳහා හිඟ). තවද, නියමිත කාලසීමාවකින් පසු ශේෂයන් නිරාකරණයන්න ගැනීම සඳහා ස්ථාපිත ක්‍රියාවලියක් නොමැති බව නිරීක්ෂණය විය. මෙය දිගුකාලීන හිඟ අතිරික්ත වාරික ශේෂයන් සමුච්චය වීමට හේතු වී ඇත. | ගනුදෙනුකරුවන් විසින් ගෙවන ලද හඳුනා නොගත් බැර ශේෂ මෙයට ඇතුළත් වේ. මෙම ශේෂයන් අදාළ දෙපාර්තමේන්තු විසින් නිරන්තරව පසු විපරම් කරනු ලැබේ. ප්‍රවර්තන වර්ෂය තුළ රු. මිලියන 146ක් ආපසු ගෙවා ඇත. කෙසේ වෙතත්, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ මාර්ගෝපදේශයන්ට අනුව මෙම ශේෂයන් තැන්පතු ලෙස පවත්වාගෙන යා යුතු අතර ලාභයට හඳුනාගත නොහැක. | එම ශේෂයන් හඳුනාගෙන නියමිත වේලාවට ආපසු ගෙවීම සඳහා යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම නිර්දේශ කෙරේ. |

### 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- | --- |
| (අ.) | 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය නියාමනය කිරීමේ පනතේ 35 වැනි වගන්තිය | පහත අවස්ථාවලදී හැර ජීවිත රක්‍ෂණ ව්‍යාපාරයක් නොවන වෙනත් රක්‍ෂණ ව්‍යාපාරයක් සම්බන්ධයෙන් එවැනි රක්‍ෂණකරු විසින් බලපෑමට ලක් වූ හෝ නිකුත් කරන ලද කිසියම් කොන්ත්‍රාත්තුවක් හෝ රක්‍ෂණ ඔප්පුවක් යටතේ ගෙවිය යුතු මුදල ගෙවීමට රක්‍ෂකයකු වගකිව යුතු නොවේ.<br><br>(අ.) එවැනි කොන්ත්‍රාත්තුවක් හෝ ඔප්පුවක් යටතේ ගෙවිය යුතු සම්පූර්ණ වාරිකය එම මුදල ගෙවිය යුතු දිනයේ ගෙවා ඇති; හෝ<br><br>(ආ.) එම වාරික ගෙවීම සඳහා බැංකු ඇපකරයක් රක්ෂිතයා හෝ තැරැව්කරු විසින් එම මුදල ගෙවිය යුතු දිනයේ දී සපයා ඇති අතර රක්ෂණකරු හෝ තැරැව්කරු එම වාරිකය මණ්ඩලය විසින් තීරණය කළ හැකි කාල සීමාවක් තුළ ගෙවා තිබීම. | මෙම වාහන මුලින් පුද්ගලික භාවිතය යටතේ රක්ෂණය කර ඇති නමුත් හිමිකම් පෑමේදී කුලී පදනම මත භාවිතා කර ඇත. එබැවින් එම හිමිකම් ඉල්ලීම් ප්‍රතික්ෂේප කර තිබුණි. රක්ෂිතයා විසින් කරන ලද අභියාචනා සලකා බැලීමෙන් පසු, ව්‍යාපාරික සබඳතා සහ අනාගත ව්‍යාපාර විභවය සලකා බලා කුලියට දීමේ ආවරණය ඇතුළත් කිරීමෙන් පසු හිමිකම් ගෙවන ලදී. හිමිකම් ගෙවීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීම සඳහා කුලී ආවරණය සඳහා අය කරන අතිරේක වාරික පමණක් හිමිකම් ගෙවීම් වලින් අඩු කර ඇත.. | අදාළ නීති සහ රෙගුලාසිවල විධිවිධානවලට අනුකූලව සමාගම විසින් රක්ෂණය වන්දිම ගෙවීම් හිමිකම් නිරවුල් කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | කෙසේ වෙතත්, රු. 514,434 ක මෝටර් හිමිකම් ගෙවීම් 13 ක් රු. 153,789 හිඟ වාරික අය කර නොගෙන පියවා ඇත. තවද, ආයතනය විසින් හිඟ වාරික හිමිකම් ගෙවීම වලට එරෙහිව කපා හැර ඇති බව නිරීක්ෂණය විය. | | |
| (ආ.) | 2017 සංයුක්ත මනා පාලනය පිළිබඳ මාර්ගෝපදේශ සංග්‍රහයේ A.5.4 වගන්තිය | මාර්ගෝපදේශයට අනුව සෑම විධායක නොවන අධ්‍යක්ෂවරයෙකුම ඔහුගේ/ඇයගේ ස්වාධීනත්වය හෝ ස්වාධීන නොවීම පිළිබඳ ප්‍රකාශයක් වාර්ෂිකව උපලේඛන K හි දක්වා ඇති නිශ්චිත නිර්ණායකයන්ට අනුව ඉදිරිපත් කළ යුතුය. කෙසේ වෙතත්, වාර්ෂික ප්‍රකාශය ඉදිරිපත් කර තිබුණේ අධ්‍යක්ෂවරුන් හත් දෙනෙකුගෙන් (07) හය දෙනෙකු (06) පමණි. | අධ්‍යක්ෂවරුන් නියම කර ඇති මාර්ගෝපදේශවලට අනුකූල නොවීම පිළිබඳව සභාපතිවරයාට දැනුම් දෙන ලෙස සමාගම් ලේකම්වරයාට උපදෙස් දෙන ලදී. | වාර්ෂික ප්‍රකාශය සෑම අධ්‍යක්ෂවරයෙකු විසින්ම වාර්ෂික පදනමින් සිදු කළ යුතුය. |
| (ඇ.) | 2017 සංයුක්ත මනා පාලනය පිළිබඳ මාර්ගෝපදේශ සංග්‍රහයේ B.3 වගන්තිය | උපලේඛන D අනුව, වාර්ෂික වාර්තාව මගින් වැටුප් ප්‍රතිපත්තිය යටතේ පහත හෙළිදරව් කිරීම් ආවරණය කළ යුතුය;<br>- මූලික වැටුප්<br>- වරප්‍රසාද හා ප්‍රතිලාභ<br>- කාර්යසාධන ප්‍රසාද දීමනා<br>- විශ්‍රාම හිමිකම් ආදිය.<br>කෙසේ වෙතත්, 2022 වර්ෂය සඳහා වන සමාගමේ වාර්ෂික වාර්තාවේ එම හෙළිදරව් කිරීම් සිදු කර නොතිබුණි. | අධ්‍යක්ෂවරුන්ගේ වේතන පිළිබඳ සාරාංශයක් 2022 වර්ෂයේ වාර්ෂික වාර්තාවේ 164 පිටුවේ අනාවරණය කර ඇත. | කළමනාකාරිත්වය ඔවුන්ගේ වේතන ප්‍රතිපත්තිය සම්පූර්ණ ආකාරයෙන් වාර්ෂික වාර්තාවේ ඉදිරිපත් කළ යුතුය. |
| (ඈ.) | 2017 සංයුක්ත මනා පාලනය පිළිබඳ මාර්ගෝපදේශ සංග්‍රහයේ G.2 වගන්තිය | මූලධර්මය අනුව, මණ්ඩලය විසින් අනුමත කළ යුතු සයිබර් ආරක්ෂණ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තියක් හඳුන්වාදීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රමාණවත් විශේෂඥතාවක්, අධිකාරියක් සහ අයවැය ප්‍රතිපාදන සහිත ප්‍රධාන තොරතුරු ආරක්ෂක නිලධාරියෙකු (CISO) පත් කළ යුතුය. කෙසේ වෙතත්, ප්‍රධාන තොරතුරු | අපගේ තොරතුරු තාක්ෂණ කාර්යය පීපල්ස් ලීසින් සමූහයේ තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව විසින් කළමනාකරණය කරනු ලබයි. ඔවුන් ප්‍රමාණවත් ප්‍රවීණත්වයක් සහ අධිකාරියක් සහිත තොරතුරු ආරක්ෂක නිලධාරියෙකු (ISO) එකක් පත් කර ඇති අතර දැනට ප්‍රධාන | සමාගම සඳහා ප්‍රධාන තොරතුරු ආරක්ෂක නිලධාරියෙකු සහ අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කළ සයිබර් ආරක්ෂණ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තියක් තිබිය යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | ආරක්ෂක නිලධාරියෙකු (CISO) පත් කර නොතිබීම හෝ ආයතනය සඳහා සයිබර් ආරක්ෂණ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තියක් සකස් කර නොමැති බව නිරීක්ෂණය විය. | තොරතුරු ආරක්ෂක නිලධාරියෙකු (CISO) බඳවා ගැනීම සඳහා කටයුතු කරමින් සිටී. අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු විසින් නිර්දේශ කර ඇති පරිදි සයිබර් ආරක්ෂණ කළමනාකරණ ප්‍රතිපත්තියක් අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු තාක්ෂණ අනුකමිටුව වෙත ඉදිරිපත් කර නිර්දේශය ලබාගෙන ඇති අතර එය 2023 දෙසැම්බර් 04 දින මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කෙරේ. | |
| (ඉ.) | ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ තීරක අංක 03 | තීරක යට අනුව, වාරික ගෙවීමේ කාලසීමාව වාරිකය ගෙවිය යුතු දින සිට දින 60ක් ලෙස නියම කළ යුතුය. කෙසේ වෙතත්, සමාගම ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ අංක 03 දරන තීරණයට පටහැනිව විවිධ ප්‍රතිපත්ති සඳහා දින 90 සිට 120 දක්වා ණය කාලය ලබා දී තිබුණි. | සටහන් කර ගතිමි. කර්මාන්තයේ තරඟකාරිත්වය පවත්වා ගැනීම සඳහා අපි මෙම ප්‍රවේශය සීමිත ලෙස පිළිපදින්නෙමු. අංක 03 තීරකයට අනුකූල වන පරිදි ලබා දී ඇති ණය කාල සීමාවන් අපි ක්‍රමයෙන් අඩු කරමින් සිටිමු. | ණය ප්‍රතිපත්තිය රටේ ව්‍යවස්ථාපිත අවශ්‍යතාවලට අනුකූල විය යුතුය. |
| (ඊ.) | ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් 2023 අප්‍රේල් 24 වැනි දින නිකුත් කරන ලද “සාමාන්‍ය රක්‍ෂණ නිෂ්පාදන සඳහා ප්‍රතිපත්ති රාමුව පිළිබඳ මාර්ගෝපදේශ” හි 4.9 වගන්තිය | සමාගමේ නීති දෙපාර්තමේන්තුව විසින් දැනට භාවිතා කරන ගිවිසුම් උපලේඛනයට පහත සඳහන් අංග ඇතුළත් නොවන බව නිරීක්ෂණය විය.<br>• සමුද්‍ර ප්‍රතිපත්ති හැර රක්ෂණාවරණය ආරම්භ කළ දිනය සහ ආවරණයේ කාලසීමාව.<br>• අදාළ අතිරේක වාරික ඇතුළුව රක්ෂණ හිමියා විසින් තෝරා ගන්නා ලද අතිරේක ආවරණ. ප්‍රතිපත්ති ලේඛනයේ කොටස වෙත යොමුව.<br>• තැරැව්කරුගේ හෝ නියෝජිතයාගේ කේතය (අදාළ නම්).<br>• නෛතික නියෝජිතයාගේ/පැවරුම්කරුගේ (අදාළ නම්) විස්තර (නම, | වෙනස්කම් හඳුනාගෙන ඇති අතර පද්ධතිය වෙනස් කිරීම සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ දෙපාර්තමේන්තුවට යවනු ලැබේ. දැනටමත් පවතින ක්ෂේත්‍ර සහ 2024 සිට ඇතුළත් කිරීමට නියමිත නව ක්ෂේත්‍ර පහත සඳහන් කර ඇත.<br>• ආරම්භක දිනය - දැනටමත් ප්‍රතිපත්ති උප්ලේඛනයේ ඇත.<br>• ආවරණ කාලය - ඇතුළත් කිරීමට නියමිතය.<br>• අමතර ආවරණය - අදාළ නොවේ.<br>• තැරැව්කරුගේ හෝ නියෝජිතයාගේ කේතය - ඇතුළත් කිරීමට නියමිතය.<br>• නීත්‍යානුකූල නියෝජිතයාගේ/පැවරුම්කරු | අවශ්‍ය සියලුම අංග සමාගමේ ප්‍රතිපත්ති උපලේඛණයට ඇතුළත් කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | ලිපිනය, සම්බන්ධතා තොරතුරු ආදිය).<br>• උපරිම ආවරණ සීමාවන්, වාරික සහ වෙනත් ගාස්තු (අදාළ නම්). | ගේ විස්තර - අදාළ නොවේ.<br>• උපරිම ආවරණ සීමාවන් - දැනටමත් ප්‍රතිපත්ති උපලේඛනයේ ඇත<br>• වාරික - ඇතුළත් කිරීමට නියමිතය. | |
| (උ.) | ආයෝජන කමිටු ප්‍රඥප්තිය යටතේ මෙහෙයුම් පරිචයන් 03 ඡේදය | ආයෝජන කමිටුව අවම වශයෙන් මාස දෙකකට වරක් රැස්විය යුතුය. කෙසේ වෙතත්, 2022 වසර සඳහා රැස්වීම් දෙකක් පමණක් පවත්වා ඇති බව නිරීක්ෂණය විය. | සටහන් කර ගන්නා ලදී. අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගැනීමෙන් පසු සමාගමේ හිමිකම් ගෙවීම් වියදම් සහ කෙටිකාලීන මුදල් අවශ්‍යතා සලකා බලා ආයෝජන ආදායම උපරිම කර ගැනීමට මෙම තීරණය ගෙන ඇත. | ආයෝජන කමිටුව නිතිපතා රැස්විය යුතුය. |
| (ඌ.) | නීතිමය ක්‍රියා පටිපාටි අත්පොත | නීතිමය ක්‍රියාපටිපාටි අත්පොතට අනුව රක්ෂණ මුදල රුපියල් මිලියන 100 ඉක්මවන්නේ නම් සම රක්ෂණ ක්‍රියාවලියක් තිබිය යුතුය. ප්‍රාරක්ෂණ ක්‍රියාවලියට පෙර සම රක්ෂණ විධිවිධාන අනුගමනය කළ යුතු අතර සම-රක්ෂණකරුගෙන් තහවුරු කිරීමෙන් පසු සාමාන්‍ය ක්‍රියා පටිපාටියට අනුව හිමිකම් ප්‍රතිපත්තිය නිකුත් කළ යුතුය. කෙසේ වෙතත්, රු. මිලියන 100 ඉක්මවූ රු.මි. 589.5 ක් වටිනා හිමිකම් රක්ෂණ ඔප්පු තුනක් සඳහා සමරක්ෂණ ආවරණ ලබාගෙන නොතිබුණි. | හිමිකම් රක්ෂණය සම්බන්ධයෙන් 2023 දෙසැම්බර් 08 දින සිට බලපැවැත්වෙන පරිදි සමරක්ෂණ පත්‍රිකාවක් (Coinsurance closing Slip) හඳුන්වා දී ඇත.. | රක්ෂණ මුදල නියමිත සීමාව ඉක්මවා ගියහොත් සම රක්ෂණ ආවරණයක් ලබාගත යුතුය. |

## 1.8 මුදල් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ.) | හඳුනා නොගත් බැර රු. 52,369,386 ක් බැංකු ගිණුම් හතරක සමුච්චිත වී ඇති අතර ගිණුම්වල සටහන් කර නොමැත. දැනට මෙම ශේෂයන් මූලාමය වශයෙන් සටහන් කිරීමට හඳුනාගත් ක්‍රියාවලියක් නොමැත. එබැවින්, මුදල් සහ මුදල් සමාන අගයන් රු. 52,369,386 කින් අවතක්සේරු වී ඇත. | සමාගමේ ප්‍රතිපත්තියට අනුව, මෙම හඳුනා නොගත් ලදුපත් මාස තුනක් සම්පූර්ණ වූ පසු පොදු ලෙජරයට හඳුනාගනු ලැබේ. මෙම බැර අගයන් අඛණ්ඩ පදනමින් නිෂ්කාශනය වන බව සහතික කිරීම සඳහා දෛනික අධීක්ෂණ ක්‍රියාවලිය ක්‍රියාත්මක වේ. කෙසේ වෙතත්, මෙම ශේෂයන් මූලාමය වශයෙන් සටහන් කිරීමේ ක්‍රියාවලියක් ස්ථාපිත කිරීමට අපි සලකා බලමින් සිටිමු. | කාලෝචිත ලෙස බැංකු ගිණුම්වල සෘජු බැර ගනුදෙනු හඳුනා ගැනීම නිර්දේශ කෙරේ. |

| | | | |
|---|---|---|---|
| (ආ.) | සමාගමේ ආයෝජන මෙහෙයුම් අත්පොතේ 2.1 ඡේදයට අනුව, දිගුකාලීන ආයෝජන සහ කෙටි කාලීන ආයෝජන සඳහා සමාගමේ ආයෝජන මිශ්‍රණය පිළිවෙලින් සියයට 40ක් සහ සියයට 60ක් විය යුතුය. කෙසේ වෙතත් 2022 දෙසැම්බර් 31 දිනට සමාගමේ දිගුකාලීන ආයෝජන සියයට 74 ක් එනම් රු. 6,470,865,303ක් වූ අතර කෙටිකාලීන ආයෝජන සියයට 26 ක් එනම් රු. 2,223,514,875 ක් විය.. | සටහන් කර ගන්නා ලදී. අවශ්‍ය අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගැනීමෙන් පසු සමාගමේ හිමිකම් ගෙවීම් වියදම් සහ කෙටිකාලීන මුදල් අවශ්‍යතා සලකා බලා ආයෝජන ආදායම උපරිම කර ගැනීමට මෙම තීරණය ගෙන ඇත. | සමාගමේ ආයෝජන ප්‍රතිපත්තියට අනුව දිගුකාලීන හා කෙටි කාලීන ආයෝජන අතර විචක්ෂණශීලී ආයෝජන මිශ්‍රණයක් තිබිය යුතුය.. |

## 1.9 තොරතුරු තාක්ෂණ (IT) පොදු පාලන ක්‍රම

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ.) | සමාගම අභ්‍යන්තර විගණන සේවාවන්හි කොටසක් ලෙස හෝ ස්වාධීන බාහිර සමාලෝචන අභ්‍යාසයක් ලෙස තොරතුරු තාක්ෂණ පද්ධති විගණනයක් සිදු කර නොමැති බව සටහන් විය. තොරතුරු පද්ධති විගණනයක් නොමැතිකම නිසා කළමනාකාරිත්වයට එහි මෙහෙයුම් පිළිබඳ විශ්වාසදායක මූල්‍ය වාර්තා ලබා ගැනීමට නොහැකි වීම මෙන්ම සමාගමේ අරමුණු සාක්ෂාත් කර ගැනීමට අපොහොසත් වීමට හේතු විය හැකි වංචා සහ එහි වත්කම් අනිසි ලෙස පරිහරණය කිරීම වැලැක්වීම හෝ අවම කිරීම සිදුකළ නොහැකි විය හැක.. එබැවින්, තොරතුරු තාක්ෂණ පරිසරය පිළිබඳ පාලනය ඵලදායී ලෙස ක්‍රියාත්මක වන බව සහතික කිරීම සඳහා කළමනාකරණය තොරතුරු පද්ධති විගණන කාර්යයක් ඉටු කිරීම ඉතා වැදගත් වේ. | නිරීක්ෂණය සමඟ එකඟ වේ. | තොරතුරු පද්ධති විගණනයක් කාලීනව සිදුකිරීම නිර්දේශ කෙරේ. |
| (ආ.) | 2022 දෙසැම්බර් 31 වැනි දින GIS සහ HR පද්ධති දෙකෙහිම සක්‍රීය භාවිත නොවන පරිශීලක ගිණුම් 32ක් පවතින බව නිරීක්ෂණය විය. පද්ධතියක් තුළ භාවිත නොකළ සක්‍රීය පරිශීලක ගිණුම් තිබීම, පුද්ගලයකුට යෙදුම වෙත අනවසර ප්‍රවේශය ලබා ගැනීමේ සම්භාවිතාව සැලකිය යුතු ලෙස වැඩි කරයි. තවද, මෙමගින් වගවීම නොමැතිකම සහ මෙම ගිණුම් හරහා ප්‍රවේශ විය හැකි තොරතුරු අවභාවිතා විය හැක. | GIS පද්ධතිය තුළ, දින 90ක් භාවිතා නොකරන පරිශීලක ගිණුම් ස්වයංක්‍රීයව අක්‍රියාව කිරීමේ ක්‍රියාවලියක් දැනටමත් 2023 ජනවාරි මාසයේදී ක්‍රියාත්මක කර ඇත.. ඉන් පසුව පරිශීලකයින් තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුවට පුද්ගලිකව අමතා ඔවුන්ගේ ගිණුම් නැවත සක්‍රීය කිරීම අවශ්‍ය වේ. HRIS පද්ධතිය සඳහා, මේ සඳහා යාන්ත්‍රණයක් ඇතුළත් කිරීමට අපි සැපයුම්කරුට උපදෙස් ලබා දී ඇත. | යෙදුමෙන් එවැනි පරිශීලක ගිණුම් කඩිනමින් අක්‍රිය කිරීම නිර්දේශ කෙරේ, |

| | | | |
|---|---|---|---|
| (ඇ.) | ව්‍යාපාරික අවශ්‍යතා අනුව තොරතුරු ආරක්‍ෂාව සඳහා මෙහෙයවීම සහ සහාය කළමනාකරණය වෙත සැපයීම සඳහා ප්‍රමාණවත් තොරතුරු ආරක්ෂණ ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි සමාගම සතුව නොමැති බව සටහන් විය.. | නිරීක්ෂණය සමග එකඟ විය. දැනට අපි සමාගම තුළ ක්‍රියාත්මක කිරීම සඳහා පහත ප්‍රතිපත්ති ද තෝරාගෙන ඇත. යෝජනා කර ඇති බොහෝ ක්ෂේත්‍ර මෙම ප්‍රතිපත්ති මගින් ආවරණය කෙරෙනු ඇත. | කළමනාකරණය සියළු ව්‍යාපාරික අරමුණු වලට අනුකූලව පැහැදිලි ප්‍රතිපත්තිමය දිශානතියක් සැකසිය යුතු අතර සංවිධානය පුරා ප්‍රමාණවත් තොරතුරු ආරක්ෂණ ප්‍රතිපත්තියක් නිකුත් කිරීම සහ නඩත්තු කිරීම හරහා තොරතුරු ආරක්ෂාව සඳහා සහය සහ කැපවීම පෙන්නුම් කළ යුතුය. |
| (ඇ.) | සමාගම විධිමත් ව්‍යාපාර අඛණ්ඩ සැලැස්මක් භාවිතා නොකරන බව නිරීක්ෂණය විය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, ව්‍යසනයක දී, පිළිගත හැකි කාල සීමාවක් තුළ සහ ආරම්භය තුළ එහි තීරණාත්මක ව්‍යාපාරික මෙහෙයුම් සහ අදාළ සම්පත් (පුද්ගලයන්, ස්ථානය, යටිතල පහසුකම්, වැදගත් ලියකියවිලි වැනි) නැවත ලබාගෙන ප්‍රතිෂ්ඨාපනය කිරීමට සමාගමට නොහැකි විය හැකිය. | නිරීක්ෂණය සමග එකඟ වේ. දැනට ව්‍යාපාර බලපෑම් විශ්ලේෂණය අවසන් කර ඇත. නව අනුකූලතා නිලධාරියෙකු බඳවා ගත් පසු, අවශ්‍ය ක්‍රියාමාර්ග සන්නිවේදනය කරනු ඇත. | ව්‍යාපාර අඛණ්ඩ සැලැස්මක අවශ්‍යතාවය කළමනාකරණය අවබෝධ කරගෙන එම සැලැස්ම පරීක්ෂා කිරීම, පුහුණු කිරීම සහ අඛණ්ඩව යාවත්කාලීන කිරීම නිර්දේශ කෙරේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය බදු පෙර ලාභය රු. මිලියන 1,613.33 ක් වූ අතර, පෙර වසරේ බදු ගෙවීමට පෙර අනුරූප ලාභය රු. මිලියන1,095.85 කි. එබැවින්, රු. මිලියන 517.49 ක මූල්‍ය ප්‍රතිඵලයෙහි වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වැඩි දියුණු වීම සඳහා දළ ලිඛිත වාරිකය රුපියල් මිලියන 164.1 කින් වැඩි වීම, පොලී සහ ලාභාංශ ආදායම රු. මිලියන 648.3 කින් වැඩිවීම සහ ප්‍රතිරක්ෂණ සහ ශුද්ධ අත්පත් කර ගැනීමේ පිරිවැය සමාලෝචිත වර්ෂය සඳහා රු. මිලියන 49.7 කින් අඩුවීම හේතු වී ඇත.

සමාගම විසින් සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රාරක්ෂණ මෙහෙයුම් වලින් රු. මිලියන 402.6 ක පාඩුවක් ලබා ඇත. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය සඳහා ආයෝජන ආදායම රු. මිලියන 1,305.87 ක් වීම හේතුවෙන් සමාගම සමාලෝචිත වර්ෂය සඳහා ශුද්ධ ලාභය රු. මිලියන 635.96 ක් ලබා තිබුණි. කෙසේ වෙතත්, අනාගතයේදී සාමාන්‍ය පොලී අනුපාත අඩු කිරීමේදී සමාගමට එම ලාභය පවත්වා ගත හැකිද යන්න සැක සහිත වේ.

## 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

පෙර වසර හතර (04) හා සසඳන විට සමාලෝචිත වර්ෂයේ ප්‍රධාන ආදායම් සහ වියදම් අයිතමවල වැඩිවීමේ හෝ අඩුවීමේ ප්‍රතිශතය සමඟ විශ්ලේෂණය පහත පරිදි වේ..

| අයිතමය | 2022<br>රු.මිලියන | 2021<br>රු.මිලියන | 2020<br>රු.මිලියන | 2019<br>රු.මිලියන | 2018<br>රු.මිලියන |
|---|---|---|---|---|---|
| **දළ ලිඛිත වාරිකය** | **6,132.06** | **5,967.95** | **6,011.57** | **6,029.97** | **5,591.82** |
| *විචලනය* | 164.11 | (43.62) | (18.41) | 438.16 | 809.90 |
| *වැඩි වීම/(අඩු වීම)* | 3% | -1% | 0% | 8% | 17% |
| **දළ උපයා නොගත් වාරික සඳහා සංචිත වෙනස් වීම** | **189.88** | **18.03** | **(90.93)** | **(228.59)** | **(430.50)** |
| *විචලනය* | 171.85 | 108.95 | 137.66 | 201.91 | 174.99 |
| *වැඩි වීම/(අඩු වීම)* | 953% | -120% | -60% | -47% | 68% |
| **දළ ඉපැයූ වාරිකය** | **6,321.94** | **5,985.98** | **5,920.64** | **5,801.39** | **5,161.32** |
| *විචලනය* | 335.96 | 65.34 | 119.26 | 640.07 | 634.91 |
| *වැඩි වීම/(අඩු වීම)* | 6% | 1% | 2% | 12% | 14% |
| **ප්‍රතිරක්ෂණකරුවන්ට පවරා ඇති වාරික** | **1,428.95** | **923.80** | **674.92** | **580.76** | **482.18** |
| *විචලනය* | 505.15 | 248.88 | 94.15 | 98.58 | 54.44 |
| *වැඩි වීම/(අඩු වීම)* | 55% | 37% | 16% | 20% | 13% |
| **උපයා නොගත් ප්‍රතිරක්ෂණ වාරිකය සඳහා සංචිත වෙනස් වීම** | **98.78** | **58.45** | **57.67** | **41.11** | **30.35** |
| *විචලනය* | 40.34 | 0.78 | 16.55 | 10.76 | 31.83 |
| *වැඩි වීම/(අඩු වීම)* | 69% | 1% | 40% | 35% | -2150% |
| **ශුද්ධ ඉපැයූ වාරිකය** | **4,991.77** | **5,120.63** | **5,303.39** | **5,261.74** | **4,709.49** |
| *විචලනය* | (128.86) | (182.77) | 41.66 | 552.25 | 612.30 |
| *වැඩි වීම/(අඩු වීම)* | -3% | -3% | 1% | 12% | 15% |
| **ගාස්තු ආදායම** | **74.52** | **54.30** | **53.09** | **53.99** | **49.39** |
| *විචලනය* | 20.22 | 1.21 | (0.91) | 4.6 | 7.59 |
| *වැඩි වීම/(අඩු වීම)* | 37% | 2% | -2% | 9% | 18% |
| **පොලී සහ ලාභාංශ ආදායම** | **1,305.87** | **657.54** | **751.89** | **781.34** | **664.30** |
| *විචලනය* | 648.34 | (94.35) | (29.45) | 117.04 | 38.65 |
| *වැඩි වීම/(අඩු වීම)* | 99% | -13% | -4% | 18% | 6% |
| **ශුද්ධ සාධාරණ වටිනාකම් ලාභ** | **-** | **55.01** | **19.28** | **3.08** | **23.42** |
| *විචලනය* | (55.01) | 35.72 | 16.20 | (20.35) | (1.22) |
| *වැඩි වීම/(අඩු වීම)* | -100% | 185% | 526% | -87% | -5% |
| **ශුදධ ප්‍රතිලාභ සහ හිමිකම්** | **(3,638.29 )** | **(2,994.32 )** | **(2,699.55 )** | **(3,552.58 )** | **(3,237.23 )** |
| *විචලනය* | (643.97) | (294.77) | 853.02 | (315.35) | (6,078.18) |
| *වැඩි වීම/(අඩු වීම)* | 22% | 11% | -24% | 10% | -214% |
| **මූල්‍ය පිරිවැය** | **(38.88)** | **(11.56)** | **(19.94)** | **(26.08)** | **Nil** |

| | | | | | |
|---|---|---|---|---|---|
| *විචලනය* | (27.32) | 8.37 | 6.14 | (26.08) | Nil |
| *වැඩි වීම/(අඩු වීම)* | 236% | -42% | -24% | Nil | Nil |
| **ශුද්ධ ප්‍රතිලාභ, පාඩු සහ වියදම්** | **5,394.38** | **4,736.63** | **4,495.21** | **5 ,196.50** | **4,585.65** |
| *විචලනය* | 657.75 | 241.42 | 701.28 | 610.84 | (8,510.37) |
| *වැඩි වීම/(අඩු වීම)* | 14% | 5% | -13% | 13% | -217% |
| **වර්ෂය සඳහා ශුද්ධ ලාභය** | **1,249.02** | **906.43** | **1,218.30** | **759.82** | **3,950.22** |
| *විචලනය* | 342.59 | 311.87 | 458.48 | 30.76 | 364.64 |
| *වැඩි වීම/(අඩු වීම)* | 38% | -26% | 60% | 4% | 10% |
| **අස්පෘශ්‍ය වත්කම්** | **5.42** | **8.20** | **10.97** | **1.88** | **2.39** |
| *විචලනය* | -2.77 | -2.77 | 9.09 | -0.51 | 1.29 |
| *වැඩි වීම/(අඩු වීම)* | -34% | -25% | 485% | -21% | 117% |
| **දේපල, පිරියත සහ උපකරණ** | **381.71** | **123.15** | **185.48** | **238.21** | **82.01** |
| *විචලනය* | 258.56 | -62.33 | -52.74 | 156.21 | -2.38 |
| *වැඩි වීම/(අඩු වීම)* | 210% | -34% | -22% | 190% | -3% |
| **ලැබිය යුතු ප්‍රතිරක්ෂණ** | **557.60** | **421.01** | **211.14** | **503.59** | **153.12** |
| *විචලනය* | 136.60 | 209.86 | -292.45 | 350.48 | -96.60 |
| *වැඩි වීම/(අඩු වීම)* | 32% | 99% | -58% | 229% | -39% |
| **මුදල් සහ මුදල් සමාන දෑ** | **154.22** | **68.32** | **50.97** | **128.77** | **221.39** |
| *විචලනය* | 85.91 | 17.34 | -77.80 | -92.62 | 104.73 |
| *වැඩි වීම/(අඩු වීම)* | 126% | 34% | -60% | -42% | 90% |
| **වෙනත් මූල්‍ය වගකීම්** | **965.28** | **641.28** | **748.44** | **676.31** | **400.73** |
| *විචලනය* | 324.00 | -107.15 | 72,13 | 275.58 | -8.23 |
| *වැඩි වීම/(අඩු වීම)* | 51% | -14% | 11% | 69% | -2% |
| **ගෙවිය යුතු ප්‍රතිරක්ෂණ** | **180.79** | **244.38** | **65.50** | **7.53** | **61.81** |
| *විචලනය* | (63.59) | 178.88 | 57.97 | (54.28) | 26.09 |
| *වැඩි වීම/(අඩු වීම)* | -26% | 273% | 770% | -88% | 73% |
| **බැංකු අයිරාව** | **198.77** | **69.32** | **18.63** | **150.62** | **86.05** |
| *විචලනය* | 129.44 | 50.70 | -131.99 | 64.56 | 17.22 |
| *වැඩි වීම/(අඩු වීම)* | 187% | 272% | -88% | 75% | 25% |
| **තාක්ෂණික සංචිතය - සමාගම** | **4,086.66** | **4,166.22** | **4,136.07** | **4,130.47** | **3,950.22** |
| *විචලනය* | 79.56 | 30.15 | 5.60 | 180.25 | 364.64 |
| *වැඩි වීම/(අඩු වීම)* | -2% | 1% | 0% | 5% | 10% |

### 2.3 අනුපාත විශ්ලේෂණය

පසුගිය වසර පහ සඳහා සමාගම සඳහා ගණනය කරන ලද ප්‍රධාන අනුපාත පහත පරිදි වේ.

| සමාගම සඳහා විශේෂිත අනුපාත | 2022 | 2021 | 2020 | 2019 | 2018 | අදහස් දැක්වීම |
|---|---|---|---|---|---|---|
| රදවා ගැනීමේ අනුපාතය | 81.4% | 85.8% | 88.2% | 87% | 84% | |
| හිමිකම් අනුපාතය | 72.9% | 58.5% | 50.9% | 67.5% | 68.7% | සමාලෝචිත වර්ෂය සඳහා හිමිකම් අනුපාතය 2021 වසරට සාපේක්ෂව 14.4% කින් වැඩි වී ඇත. |
| වියදම් අනුපාතය | 108.1% | 92.5% | 84.8% | 98.8% | 97.4% | |
| ඒකාබද්ධ අනුපාතය | 181.0% | 151.0% | 135.7% | 181% | 166% | |
| ලාභදායිතා අනුපාතය | 16.3% | 19.6% | 27.7% | 15% | 15% | පසුගිය වසර දෙක තුළ සමාගමේ ලාභදායිතා අනුපාතය පහත වැටී තිබුණි. |
| වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය | 9.0% | 10.8% | 16.5% | 10% | 10% | |
| ආයෝජනයේ ප්‍රතිලාභ අනුපාතය | 14.7% | 7.5% | 14.7% | 11% | 10% | |
| ද්‍රවශීලතා අනුපාතය | 134.8% | 150.2% | 144.3% | 126% | 136% | |
| මුළු වත්කම් මත මූල්‍ය වත්කම් අනුපාතය | 77.5% | 81.8% | 80.9% | 77% | 79% | |
| ප්‍රාග්ධන සහ තාක්ෂණික සංචිත අනුපාතය | 113.9% | 119.8% | 111.7% | 88% | 85% | |
| තාක්ෂණික සංචිත අනුපාතය | 122.1% | 122.9% | 128.2% | 127% | 119% | |
| **වෙළෙඳපොළ අනුපාත** | | | | | | |
| වෙළෙඳපොළ කොටස (සාමාන්‍ය ) | 5% | 5.5% | 5.7% | 6% | 6% | පසුගිය වසර තුන තුළ සමාගමේ වෙළඳපල කොටස සුළු වශයෙන් අඩු වී ඇත. |
| **Profitability and Return** | | | | | | |
| ආදායමේ වර්ධනය | 7.6% | -4.4% | 0.9% | 11% | 12% | |
| හිමිකම් මත ප්‍රතිලාභ අනුපාතය | 13.7% | 19.6% | 25.9% | 18% | 22% | පසුගිය වසර තුන තුළ කොටස් මත ප්‍රතිලාභ අඛණ්ඩව අඩු වී ඇත. |
| වත්කම් පිරිවැටුම | 1.07 | 1.03 | 1.15 | 1.44 | 1.40 | |
| ශුද්ධ ලාභ අනුපාතය | 12.7% | 19.4% | 10.6% | 12% | 15% | සමාලෝචිත වර්ෂය සඳහා ශුද්ධ ලාභ අනුපාතය 6.7% කින් අඩු වී ඇත. |

**ද්‍රවශීලතාවය**

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| ජංගම අනුපාතය | 3.00 | 3.50 | 3.25 | 6.62 | 6.79 | |
| **ආයෝජන ප්‍රතිලාභ** | | | | | | |
| කොටසක ඉපයීම | 3.2 | 4.9 | 6 | 3.24 | 3.65 | පසුගිය වසර දෙක තුළ කොටසක ඉපයීම අඩු වී ඇත. |
| කොටසක ලාභාංශය | 2.5 | 3.0 | 3 | 1.85 | 1.85 | |
| ලාභාංශ ආවරණ අනුපාතය | 1.3 | 1.6 | 2 | 1.75 | 1.97 | |
| කොටසක ශුද්ධ වත්කම් අනුපාතය | 23.3 | 25 | 23.1 | 18.21 | 16.88 | |

| **කර්මාන්තය සමග සැසදීම** | **කර්මාන්තය** | | | | | **සමාගම** | | | | | **අදහස් දැක්වීම** |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | **2022** | 2021 | 2020 | 2019 | 2018 | **2022** | 2021 | 2020 | 2019 | 2018 | |
| වර්ධන වේගය (සාමාන්‍ය ව්‍යාපාර) | **12%** | 3% | (2%) | 6% | 9% | **2.7%** | (0.7%) | (0.3%) | 7.8% | 16.9% | පසුගිය වසර දෙක තුළ සමාගමේ වර්ධන වේගය වෙළඳපල අනුපාතයට වඩා අඩු බව නිරීක්ෂණය විය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 හඳුනාගත් පාඩු

| | **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ.) | 2011 මැයි 01 සිට 2012 මැයි 01 දක්වා කාලය සඳහා රුපියල් 137,894,556 ක මුදලකට මහජන බැංකුව වෙත ගිනි රක්ෂණයක් නිකුත් කර තිබුණි. මේ සඳහා ප්‍රතිරක්ෂණාවරණයක් විදේශ රක්‍ෂණ සමාගමක් වෙතින් රු. 39,353,000 කට ලබාගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ සිදු කෙරේ.<br><br>(i.) 2011 ජූලි 30 වන දින මෙම රක්ෂණ ආවරණය යටතේ ආවරණය වූ මහජන බැංකුවේ පුතුර් ශාඛාවේ මංකොල්ලයක් සිදු කර රුපියල් 3,640,000 ක් හා රත්‍රං කිලෝග්‍රෑම් 26.554 යි මිලිග්‍රෑම් 750 ක් සොරකම් කර තිබුණි. සමාගම විසින් රක්ෂිතයාට රක්ෂණ වන්දි වශයෙන් රුපියල් 154,544,419 ක් ගෙවා තිබුණි. මෙම සොරකම සම්බන්ධයෙන් රක්ෂණ සමාගම සතු සුන්බුන් නිරවුල් කිරීමට කටයුතු කළ යුතු නමුත් විමර්ශනයේදී සොයාගත් රත්‍රන් කිලෝග්‍රෑම් 13.093 යි මිලිග්‍රෑම් 930 ක් සහ සොයා නොගත් රත්‍රං කිලෝග්‍රෑම් 13.461 ක් සම්බන්ධයෙන් සමාගම කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත. තවද, 2019 ජනවාරි 24 වන දින සමාගමේ නීතිඥ විසින් සමාගමේ ජ්‍යෝෂ්ඨ කළමනාකරු (නීති) වෙත යොමු කරන ලද ලිපියේ | මෙම ප්‍රතිපත්තිය සඳහා අපි 2011-2012 කාලය සඳහා විදේශ ප්‍රතිරක්‍ෂණ මණ්ඩලයකින් ප්‍රතිරක්‍ෂණය ලබා ගෙන ඇත.<br><br>රක්‍ෂණ සමාගමක් වශයෙන්, රක්‍ෂිත අවදානම් යටතේ රක්‍ෂිතයා මුහුණ දෙන අවදානම් අවස්ථාවලදී රක්ෂණ ඔප්පුවේ නියමයන්ට අනුකූලව හිමිකම් පියවීම අපගේ වගකීමකි.<br><br>හිමිකම් පෑම 2011 වර්ෂයේදී සිදු වූ අතර, හිමිකම් ගෙවීමේ සාමාන්‍ය ක්‍රියාවලියට අනුව, නැතිවූ භාණ්ඩවලට අදාළ නඩුව සමථයකට පත් කරන තෙක් හෝ අධිකරණය | කළමනාකාරීත්වය නීතිමය නඩුවේ පාර්ශ්වයන් සමඟ සක්‍රීයව සම්බන්ධ විය යුතු අතර ඔවුන්ගේ හානියේ කොටස නැවත අයකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කළ යුතුය. |

අවසාන ඡේදයට අනුව, සමාගම රක්ෂිතයාගෙන් හිමිකම් පවරා ගැනීමේ ලිපියක් ලබාගෙන නොතිබුණි. මේ හේතුවෙන් සමාගමට සිදුවූ පාඩුව ආසන්න වශයෙන් රු. 255,759,000 කි.

අපට සොයාගත් භාණ්ඩ සඳහා අයිතිය ලබා දෙන තුරු හිමිකම් ගෙවීම සිදු නොකෙරේ. එහෙත් මහජන බැංකුවේ ඉහළ කළමනාකාරීත්වයේ ඉල්ලීම පරිදි, එවකට ප්‍රධාන මෙහෙයුම් නිලධාරියා විසින් ප්‍රතිරක්ෂකයන් විසින් අනුමත කරන ලද පරිදි මහජන බැංකුව ගනුදෙනුකරුවන්ට ගෙවීම් කළ බැවින්, සාපේක්ෂව කුඩා අත්තිකාරම් වරින් වර නිකුත් විය. 2022 දෙසැම්බර් 31 දිනට අත්තිකාරම් ලෙස ගෙවා ඇති මුළු හිමිකම් ප්‍රමාණය රු. මිලියන 154.54 ක්, එයින් රු. මිලියන 140.09 ක් නැවත ප්‍රතිරක්ෂණකරුවන්ගෙන් අයකරගෙන ඇත. එබැවින් සමාගම විසින් ගෙවන ලද ශුද්ධ හිමිකම් 2022 දෙසැම්බර් 31 වන විට රු. මිලියන 14.45 කි.

ගිවිසුමේ නියමයන්ට අනුව හිමිකම් පියවීමට පෙර, අපි සොයාගත් රන් භාණ්ඩ සඳහා හිමිකම් පවරා ගැනීමේ පෝරමය ලබා ගෙන ඇත.

භාණ්ඩ මුදාහැරීම නීතිමය ක්‍රියාමාර්ගවලට අනුව සිදුවන බැවින් ඒ පිළිබඳව නිරන්තරයෙන් බැංකුවෙන් තොරතුරු ඉල්ලා සිටි අතර, අධිකරණ ක්‍රියාවලියේ තත්ත්වය පිළිබඳව මහජන බැංකුව විටින් විට අපව යාවත්කාලීන කර ඇත. මහජන බැංකුව නඩුව මෙහෙයවන ආකාරය ගැන අපගේ නීති දෙපාර්තමේන්තුව සෑහීමකට පත්වේ.

(ii.) මෙම අලාභය සඳහා ජාතික රක්ෂණ භාර අරමුදලෙන් අයවිය යුතු රක්ෂණ වන්දි මුදල රු. 15,908,884 වසර 12ක් ගතවී ඇතත් අයකරගෙන නොතිබුණි..

ජාතික රක්ෂණ භාර අරමුදලෙන් අයකර ගැනීමට නියමිත මුදල් සම්බන්ධයෙන් අවශ්‍ය ලියකියවිලි ඔවුන් වෙත යවා ඇත්තේ 2019 වර්ෂයේදීය, එනම් හිමිකම් පෑම සම්පූර්ණයෙන්ම සහ අවසානයේ ගෙවා සිහි කැඳවීම් ද සිදු කළ නමුත්

| | |
|---|---|
| | විගණන ප්‍රධානියෙකු බඳවා ගැනීමෙන් පසුව ගෙවීම් කළ හැකි බව දැනුම් දෙන ලදී. විගණන ප්‍රධානියෙකු බඳවා ගැනීමෙන් පසු 2023 දෙසැම්බර් මාසයේදී මේ සඳහා අනුමැතිය ලබා දී ඇත. රාජ්‍ය ආයතනයක් ලෙස ඔවුන්ගේ පැහැදිලි කිරීම සත්‍යයක් ලෙස අප විසින් පිළිගනු ලැබිණි. එබැවින් ඔවුන්ට එරෙහිව කිසිදු නීතිමය පියවරක් නොගත් බව දන්වා සිටිමු. |
| (iii.) 2021 මාර්තු 12 දින අදාළ රටේ මූල්‍ය සේවා අධිකාරියේ දැනුම්දීම අනුව සියයට 10ක ප්‍රතිරක්‍ෂණ භාර ගත් ප්‍රතිරක්‍ෂණ සමාගම බංකොලොත් විය. එබැවින් එම සමාගමේ ප්‍රතිරක්ෂණ හිමිකම් කොටස ලෙස සමාගමට දැරීමට සිදු වූ පාඩුව රු. 13,908,997 ක් විය. | මෙම ප්‍රතිරක්ෂණ සමාගම 2010-2011 සහ 2011-2012 වර්ෂවලදී අපගේ ප්‍රතිරක්ෂණ මණ්ඩලයට සහාය දැක්වූ අතර, හිමිකම් පෑම 2011 දී සිදු විය. 2012 වසරේ සිට, ඔවුන් අපගේ ප්‍රතිරක්‍ෂණ මණ්ඩලයට සහාය නොදක්වයි. එම සමාගම මූල්‍යමය වශයෙන් ශක්තිමත්ව සිටි නමුත් 2011 වසර අවසානයේ තායිලන්තයේ සිදුවූ දරුණු ගංවතුර හේතුවෙන් කඩා වැටුණු ප්‍රතිරක්ෂණ සමාගමක් විය. ඔවුන්ගේ මූල්‍ය අස්ථාවරත්වය ඇති වූයේ හදිසි ස්වභාවික විපත් තත්ත්වය හේතුවෙනි. මෙම සමාගම 2021 වර්ෂයේ දී නොව 2013 වර්ෂයේ දී බංකොලොත් විය. 2011-2012 දී අපගේ ප්‍රතිරක්‍ෂණ ප්‍රතිපත්තියට දායක වූ අවස්ථාවේ සහ හිමිකම් පෑම සිදු වූ කාලය තුළ ශක්තිමත් වූ ආයතනයකි. මෙම බංකොලොත්භාවය ඇතිවූයේ අනපේක්ෂිත ස්වභාවික ව්‍යසනයක් නිසාය. 2013 සහ 2019 දී, ගෙවන ලද හිමිකම් ප්‍රාරක්ෂණය සඳහා මෙම ආයතනය දායක වී ඇත. |
| (iv.) රක්ෂණ සමාගම විසින් ගණුදෙණුකරුවන්ට ගෙවිය යුත්තේ රක්ෂිතයා විසින් සැබවින්ම ගෙවන ලද මුදල පමණක් වුවද, රු. 154,544,419 ක මුදලක් රක්ෂණ සමාගම වන්දි වශයෙන් ගෙවා ඇත. අලාභ ගැලපුම්කරුගේ වාර්තාව හැර, අලාභය | මහජන බැංකුව විසින් ගනුදෙනුකරුවන්ට ගෙවන ලද මුදල් ප්‍රමාණය සලකා බැලීමෙන් පසුව සහ අපගේ පාඩුව ගැලපුම්කරු ඔහුගේ වාර්තාව සඳහා මහජන බැංකුවේ අදාළ දෙපාර්තමේන්තුවලින් අවශ්‍ය |

| | | |
|---|---|---|
| | තහවුරු කිරීමට අදාළ වෙනත් ලියකියවිලි (උකස් භාණ්ඩ ලැයිස්තුව, පාරිභෝගික අලාභ ගෙවීම්, උකස් කුවිතාන්සි, දෛනික මුදල් තත්ව වාර්තාව) සාක්ෂි සමාගම විසින් ලබාගෙන නොමැත. | සියලුම ලියකියවිලි (උකස් රිසිට්පත්/ගෙවීම් ලේඛන) ආදිය එකතු කර ගැනීමෙන් පසුව අපි හිමිකම් පියවා ඇත. තවද, උකස් කුවිතාන්සි සහ අනෙකුත් ලියකියවිලි විශාල ප්‍රමාණයක් තිබූ අතර, නීතිමය කටයුතු සඳහා එම ලේඛන වරින් වර අවශ්‍ය වූ අතර, ඒවා බැංකුව භාරයේ රඳවා ගැනීමට අවසර දෙන ලදී. |
| (v (w.) | මෙම නඩුව සඳහා, රක්ෂණ සමාගම අලාභය ඉල්ලා සිටීමට බැංකුව සමඟ නීතිමය පියවර ගත යුතුව තිබුණි, කෙසේ වෙතත් එය ඒ අනුව සිදු වූ බව තහවුරු කිරීමට මට ප්‍රමාණවත් තොරතුරු ලබා දී නොමැත. සොරාගත් රන් ග්‍රෑම් 26,554.75 න් සොයා ගැනීමට හැකි වූයේ රත්‍රං ග්‍රෑම් 13,093 ක් පමණි. තවද, නීතිමය කටයුතු සඳහා ඉදිරිපත් කරන ලද වාර්තාවල පරස්පරතා නිරීක්ෂණය විය. කෙසේ වෙතත්, නීතිමය ලියකියවිලි සහ වාර්තාවල විෂමතා නිවැරදි කිරීමට සමාගම පියවර ගෙන නොතිබුණි. | අපගේ ප්‍රති-රක්‍ෂණ සමාගම් විසින් ඉදිරිපත් කරන ලද හිමිකම් පවරා ගැනීම සඳහා අපගේ නීති නිලධාරියාගේ සහ මහජන බැංකු නීති දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන ඇත. අපි බැංකුවේ බලයලත් නිලධාරීන්ගේ අත්සන් සහිතව ඉහත සඳහන් පවරා ගැනීමේ පෝරමය සම්පූර්ණ කර ලබාගෙන ඇත. අවශ්‍ය නම් එය විමර්ශනය සඳහා ඉදිරිපත් කළ හැකිය. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| ශාඛා කාර්ය සාධනය මැනීම සඳහා ස්ථාවර ක්‍රමවේදයක් හෝ ව්‍යුහයක් නොතිබූ අතර, පෙර වසරේ කාර්ය සාධනය කලාප අනුව ඇගයීමට ලක් කරන අතර ප්‍රවර්තන වසරේ කාර්ය සාධනය ශාඛා වශයෙන් ඇගයීමට ලක් කෙරේ. එබැවින් වාර්ෂිකව හා පිරිවැය මධ්‍යස්ථාන පදනමින් සැසඳීමක් කළ නොහැක. වත්මන් වර්ෂයේ ශාඛා විශ්ලේෂණයට අනුව සමාලෝචිත වර්ෂය සඳහා ශාඛා 21 න් ශාඛා 3 ක් ලාභ ලැබූ අතර ශාඛා 18 ක් පාඩු ලබා ඇත. ලාභ ලබන ශාඛාවල සමුච්චිත ලාභය රුපියල් 57,502,527 ක් වූ අතර පාඩු ලබන ශාඛා සඳහා වර්ෂය සඳහා සමුච්චිත පාඩුව රුපියල් 486,742,147 කි. | 2021 දී අපට අංශ ප්‍රධානීන් තිදෙනෙකුගේ ප්‍රධානත්වයෙන් ව්‍යාපාරික අංශ තුනක් තිබුණි. 2022 දී අංශ තුන ඒකාබද්ධ කරන ලද අතර පිරිවැය අඩු කිරීම සහ මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩි කිරීම සඳහා එක් විකුණුම් ප්‍රධානියෙකු පත් කරන ලදී. එම අලෙවි අංශ තුනෙහි විස්තර පහත දැක්වේ.<br>බැන්ක් ඇෂුවරන්ස් අංශය: බැංකු සහතික කිරීමේ නිලධාරීන් 25 කට අඩු පිරිසකට ව්‍යාපාර කැන්වස් කිරීම සඳහා දිවයින පුරා මහජන බැංකු ශාඛා 600 කට වැඩි ප්‍රමාණයක් සහ අනෙකුත් බැංකු ආවරණය කිරීමට සිදු විය. අංශයට අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීමට නොහැකි වූ අතර පිරිවැය ඉතා ඉහළ බැවින්, සමාගමේ පැවැත්ම, සේවා කාර්යක්ෂමතාව සහ පිරිවැය අඩු කිරීම සඳහා දිවයින පුරා සිටින විකුණුම් නිලධාරීන් වෙත බැංකු අනුයුක්ත කරන ලදී.<br>තැරැව්කරු සහ ආයතනික අංශය: විකුණුම් | වාර්ෂිකව ශාඛා කාර්ය සාධනය මැනීම සඳහා ස්ථාවර ක්‍රමවේදයක් හෝ ව්‍යුහයක් තිබිය යුතුය. |

නිලධාරීන් 5ක් පමණ සහ අංශ ප්‍රධානියෙක් මෙම ක්ෂේත්‍ර දෙක ආවරණය කළ අතර සමච්ඡේද ආදායමක් උපයා ගැනීමට අපේක්ෂිත ඉලක්කය සපුරා ගැනීමට නොහැකි විය. එබැවින්, තැරැව්කරු සහ ආයතනික ව්‍යාපාර වත්මන් විකුණුම් ප්‍රධානියා යටතේ ඇති ව්‍යාපාර ඒකක වෙත පවරා ඇත..

ජාතික විකුණුම්: මෙම නාලිකාවේ ප්‍රධානියා නිසි ව්‍යාපාර සැලැස්මක් නොමැතිව විවෘත කර ඇති අපගේම ශාඛා අධීක්ෂණය කරමින් පීපල්ස් ලීසිං සහ ෆිනෑන්ස් කවුන්ටරවල විකුණුම් නිලධාරීන් අධීක්ෂණය කරනු ලබයි. විකුණුම් නිලධාරීන්ගේ කඩඉම් ඉලක්ක සපුරා ගනිමින් මෙහෙයුම් කාර්යක්ෂමතාව ගෙන ඒම සඳහා පෙර විකුණුම් ව්‍යුහය ප්‍රතිව්‍යුහගත කර ඇත. 2022 වසරේ සහ 2023 වසරේ විකුණුම් සංඛ්‍යා සැසඳිය හැක. 2023 දී පාඩු අනුපාතය වැඩි දියුණු කර ඇත. කෙසේ වෙතත්, කොවිඩ්-19 වසංගත කාල සීමාව තුළ පවා විකුණුම් අංශ අපේක්ෂිත මට්ටම දක්වා ක්‍රියා කිරීමට නොහැකි වී ඇත. අපගේ සමාගමේ උපාය මාර්ගය අනුව, විකුණුම් අංශ ඔවුන්ගේ වර්තමාන ජයග්‍රහණ මට්ටම මත පදනම්ව ඉදිරි වසර 3 තුළ ලාභ ලබන තත්ත්වයට පත් කිරීමට අපි සැලසුම් කරමින් සිටින අතර ඔවුන්ගේම පිරිවැය පියවා ගැනීමට නොහැකි නම් පොකුරු කිහිපයක් නැවත ස්ථානගත කරනු ලැබේ. මෙය තුන් අවුරුදු ආයතනික සැලැස්මට ඇතුළත් කෙරේ.

**3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ.) | නීති දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂය සඳහා හර සටහන් නොමැතිව රු.1,616,250,000 ක හිමිකම් රක්ෂණ ඔප්පු ප්‍රාරක්ෂණය කර ඇත. එම සම රක්ෂණ විධිවිධාන සනාථ කිරීමට නීති දෙපාර්තමේන්තුවට ඇති එකම සාක්ෂිය සම රක්ෂණ ඉල්ලීම් පත්‍රිකාවයි. | බදු ඉන්වොයිසි / හර සටහන් නිකුත් කර ඇති අතර ඒවා නීති දෙපාර්තමේන්තුවේ සතුව ඇත. | හිමිකම් රක්ෂණය සම්බන්ධයෙන් සමාගම නිසි ලියකියවිලි පවත්වාගෙන යා යුතු අතර විගණකවරුන්ගේ පරීක්ෂාව සඳහා එම තොරතුරු ලබා දිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ.) | සමාගම විසින් රු. 1,616,250,000 ක් වටිනා හිමිකම් රක්ෂණ ඔප්පු දහයකින් (10) වටිනාකම රු. 936,250,000 ක් වටිනා හිමිකම් රක්ෂණ ඔප්පු නවයක් (09) සමාලෝචිත වර්ෂය සඳහා එක් සම-රක්ෂණකරුවෙකු වෙත පමනක් තබා තිබූ අතර එය සමස්ත හිමිකම් රක්ෂණ ඔප්පු වලින් සියයට 58 ක් නියෝජනය කරයි. හිමිකම් රක්ෂණයට අදාළව සම-රක්ෂණකරු තෝරාගැනීමේ නිර්ණායක සහ ක්‍රියාවලිය විගණනය සඳහා ලබා දී නොතිබුණි. | 2022 වර්ෂයේ නිකුත් කරන ලද මුළු හිමිකම් රක්ෂණ ඔප්පු සංඛ්‍යාව 844ක් වූ අතර ඉන් රක්ෂණ ඔප්පු 1ක් සඳහා පමණක් සමරක්ෂණය කරන ලද අතර එම රක්ෂණාවරණය එච් එන් බී ඇෂුවරන්ස් වෙතින් සහය ලබා ගන්නා ලදී. කළමනාකාරිත්වය විසින් සමරක්ෂකයින් තෝරා ගනු ලබන්නේ ඔවුන්ගේ පළපුරුද්ද, හිමිකම් රක්‍ෂණයට ප්‍රතිරක්‍ෂණය කිරීමේ හැකියාව, සමාගම සමඟ සම රක්‍ෂණය කිරීමට ඇති කැමැත්ත, සමාගම සමඟ ව්‍යාපාරික සබඳතාව, වේගය සහ සේවාවේ ගුණාත්මකභාවය, සමාගමේ ස්ථායිතාව සහ හිමිකම් පියවීම් සඳහා සහයෝගිතාව යන කරුණු සලකා බැලීමෙනි.<br>ඉහත සාධක මත පදනම්ව, ප්‍රතිරක්ෂණකරු සහ ප්‍රතිරක්ෂණ නිලධාරියා සමරක්ෂණකරු තීරණය කරයි. | හිමිකම් රක්ෂණ අවදානම කළමනාකරණය කිරීම සඳහා අනෙකුත් රක්‍ෂණකරුවන් සමඟ සම රක්‍ෂණ විධිවිධාන කළමනාකරණය කිරීමේ සාධාරණ ප්‍රවේශයක් තිබිය යුතුය. |

**3.4** **මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මණ්ඩලයේ අනුමත පාලන ව්‍යුහයට අවශ්‍ය පරිදි දැනට සමාගමට ප්‍රධාන මානව සම්පත් නිලධාරියෙකු (CHRO) නොමැති බව නිරීක්ෂණය විය. දැනට මානව සම්පත් අංශයේ ප්‍රධානියා ලෙස කළමනාකරුවෙකු කටයුතු කරනු ලබයි. | කළමනාකරණය වඩාත් සුදුසු අපේක්ෂකයින් සම්බන්ධ කර ගැනීමේ ක්‍රියාවලියක යෙදී සිටී. ඇගයීම් සිදුවෙමින් පවතින අතර වඩාත් සුදුසු පුද්ගලයා තෝරා ගැනීමෙන් පසු ක්‍රියාවලිය අවසන් කෙරේ. | සමාගමේ පාලන ව්‍යුහයට අනුගත වීම නිර්දේශ කෙරේ. |

**4.** **ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1** **අභ්‍යන්තර විගණනය**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ.) | කෝවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් 2021 වර්ෂයේ අභ්‍යන්තර විගණන සැලැස්ම 2022 වර්ෂයේදී ක්‍රියාත්මක කර තිබුණි. සමාගමේ ව්‍යාපාර ක්‍රියාවලි 14ක් වසර දෙක තුළ ආවරණය කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේ වෙතත්, වසර දෙක සඳහා නිකුත් කර තිබුණේ ක්‍රියාවලි පිළිබඳ විගණන වාර්තා අටක් (08) පමණි. | එකඟ වේ. විගණන වාර්තාවේ දක්වා ඇති පරිදි, කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතුවෙන් 2021 වසර සඳහා යෝජිත විගණන සැලැස්ම සම්පූර්ණ කර නොමැත. නොවැම්බරයේ පැවති අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු රැස්වීමේදී මෙම කරුණ ඉදිරිපත් කර සාකච්ඡා කර ඇති අතර 2022 දී සැලැස්ම ඉදිරියට ගෙන යාමට එකඟ වී ඇත. හිටපු අභ්‍යන්තර විගණන ප්‍රධානියා සහ විගණන දෙපාර්තමේන්තුවේ අනෙකුත් කාර්ය මණ්ඩල සාමාජිකයින් ඉල්ලා අස්වීමත් සමඟ කණ්ඩායමට 2021 සිට 2022 දක්වා කාලය | සංවිධානය පුරා අභ්‍යන්තර විගණනයේ ප්‍රමාණවත් ගුණාත්මකභාවය සහ ආවරණය කළමනාකරණය විසින් සහතික කළ යුතුය. |

| | | |
|---|---|---|
| | තුළ ක්‍රියාවලි විගණන 8 ක්, අන්තර්කාලීන මූල්‍ය සමාලෝචන 8 ක් සහ ශාඛා 8 ක් පමණක් ආවරණය කිරීමට හැකි විය. ඊට අමතරව එම කාලය තුළ විශේෂ සමාලෝචන 4ක් සහ අනෙකුත් විමර්ශන කණ්ඩායම විසින් සිදු කරන ලදී. 2022 වසර තුළදී, විගණන සැලැස්මේ තත්ත්වය සහාගත කර අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව සමඟ නිතර සාකච්ඡා කරන ලද අතර අවදානම්, මෙහෙයුම් වැදගත්කම සහ සම්පත් වල පවතින සීමිත බව සැලකිල්ලට ගනිමින්, තීරණාත්මක සහ ඉහළ අවදානම් ප්‍රදේශවලට ප්‍රමුඛත්වය දෙමින් සංශෝධනය කරන ලදී. තවද අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ උපදෙස් පරිදි අභ්‍යන්තර විගණන කණ්ඩායම අතිරේක කාර්ය මණ්ඩලයක් සමඟින් ශක්තිමත් කර ඇති අතර දැනට අනුමත සැලැස්මට අනුකූලව අඛණ්ඩ සහ ස්ථාවර විගණනයක් සිදු කරමින් පවතී. යම් යම් අපගමනයන් නිසි පරිදි වාර්තා කරනු ලබන අතර අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විසින් නිරන්තරව සමාලෝචනය කරනු ලැබේ. | |
| (ආ.) සමාලෝචිත වර්ෂය සඳහා අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විසින් විගණනය කර තිබුණේ ශාඛා 18 න් 2022 ශාඛා 05 ක් පමණි. | එකඟ වේ. සමාලෝචිත කාල සීමාව තුළ පැවති ගමන් සීමා සහ ඉන්ධන හිඟය හේතුවෙන් නිතර ශාඛා චාරිකා සිදු කළ නොහැකි විය. කෙසේ වෙතත්, මණ්ඩල විගණන කමිටුව විසින් අනුමත කරන ලද පරිදි, 2023 වර්ෂය තුළ මෙහෙයුම්වල වැදගත්කම සහ අවදානම සැලකිල්ලට ගනිමින් ප්‍රධාන ශාඛා 32 ක් (ප්‍රාදේශීය ශාඛා 16 ක් ඇතුළුව) විගණනය කිරීමට යෝජනා කර ඇත. ඒ අනුව, දැනට පවතින සැලැස්ම මඟින් සමාගමේ සියලුම ප්‍රධාන ශාඛාවන් සහ එම ශාඛාවල හසුරුවන ප්‍රධාන කාර්යයන් ආවරණය කෙරේ. මෙම විගණනවලින් 80%ක් 2023.11.30 වන විට අවසන් කර ඇත. | අභ්‍යන්තර විගණනය මඟින් සාධාරණ සහ විධිමත් කාල පරාසයන් තුළ ශාඛා ජාලය ආවරණය කිරීම කළමනාකරණය විසින් සහතික කළ යුතුය. |